# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2018/3 - 2017 මැයි මස 08 වැනි සඳුදා - 2017.05.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 3/2013

**1971 අංක 52 දරන වෙළඳ නැව් පනත**

1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 126 වන සහ 321 වන වගන්ති මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

අර්ජුන රණතුංග,
වරාය හා නාවික කටයුතු අමාත්‍ය.

2017 මැයි මස 08 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2016 ඔක්තෝබර් මස 4 වැනි දිනැති, අංක 1987/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

1. එහි 6 (අ) වන නියෝගයේ ''V/1-2 යන පරිච්ඡේදවල විධිවිධානවලට අනුකූලව'' යන වචන වෙනුවට ''V/1-2 යන පරිච්ඡේදවල විධිවිධානවලට සහ මූලික පුහුණුවේ දී නිපුණතා සහතිකයට (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1 වගුව) අනුකූලව'' යන වචන ආදේශ කිරීමෙන් ;

2. එහි 19 වන නියෝගයේ (1) වන ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

'' (1) යම් නිශ්චිත ප්‍රවීණතා සහතිකයක් සඳහා යම් නිලධරයන් සඳහා නිශ්චිතව දක්වා ඇති සුදුසුකම් ලැබීමේ මුහුදු සේවය, ප්‍රවීණතාව ඇගයීම ආරම්භවීමේ දිනයට පෙරාතුව වූ වසර 10 ක කාලසීමාවක් ඇතුළත ඉටුකරනු ලැබිය යුතු අතර ප්‍රවීණතාව ඇගයීම ආරම්භවන දිනයට පූර්වයෙන් වූ වසර 5 ක් ඇතුළත මාස 12 ක මුහුදු සේවයක් ඊට ඇතුළත් විය යුතු ය. ''. ;


1A - PG 3521 — 507 (2017/05)


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. එහි 25 වන නියෝගයේ, (4) වන ඡේදය ඉවත් කිරීමෙන් ;

4. එහි 28 වන නියෝගයේ (2) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

''(2) නෞකාස්ථ කටයුතුවල දී අනුපූරක කාර්ය වශයෙන් ආරක්ෂාව සැපයීමේ කාර්ය හෝ නෞකාව ක්‍රියාකරවීමේ දී පරිසර දූෂණය වළක්වාලීමේ කාර්යවල නිරතවීම සඳහා කවර හෝ තත්ත්වයකින් සේවයේ යොදවනු ලැබූ හෝ කාර්යය පවරනු ලැබූ හෝ මුහුදු යාත්‍රාකරුවන්ට පෞද්ගලික ගැලවීමේ ශිල්පීය ක්‍රම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/ 1 වගුව), ගිනි නිවාරණය සහ ගිනි නිවීම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/ 1-2 වගුව), මූලික ප්‍රථමාධාර (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/ 1-3 වගුව), සහ පෞද්ගලික ආරක්ෂාව හා සමාජයීය වගකීම් (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/ 1-4 වගුව) පිළිබඳ අනුමත කළ මූලික පුහුණුවක් ලබා ගත යුතු ය.'' ;

5. එහි 29(5) වන නියෝගයේ ''ඒ ධජය යටතේ වූ'' යන වචන වෙනුවට ''ශ්‍රී ලංකා ධජය යටතේ වූ'' යන වචන ආදේශ කිරීමෙන් ;

6. එහි 29(6) වන නියෝගයේ, ''මේ නියෝගයේ විධිවිධාන'' යන වචන වෙනුවට ''STCW සම්මුතියේ 1/10 නියෝගයේ විධිවිධාන'' යන වචන ආදේශ කිරීමෙන්.

05 - 659

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.